# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1862/15 - 2014 මැයි මස 16 වැනි සිකුරාදා - 2014.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය : 10/3/1/3/39.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : LD/05/2007/HW/354.

වත්තේගම-කන්දෙනුවර - වාරියපොළ මාර්ගයේ අංක 25/9 පාලම ඉදිකිරීම සඳහා පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර : -*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, ගොඩපොළ ග්‍රාම නිලධාරි වසමේ, ගොඩපොළ ගමේ පිහිටි මාතලේ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් සහතික කරන ලද මා 1609 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම් කට්ටිය.

01. කැබලි අංක 01

ඉඩමේ නම: ගොඩපොළ වත්ත; ඉඩමේ විස්තරය: වත්ත සහ ලඳු කැලය; හිමිකම් කියන අය: සමන් අළුවිහාරේ මයා., අංක 27, ප්‍රධාන වීදිය, මාතලේ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0147.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 අගෝස්තු මස 20 වැනි දින පෙ. ව. 10.00ට රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 අගෝස්තු මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

බී. එම්. ජී. බී. විජේබණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
රත්තොට.

2014 අප්‍රේල් මස 21 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-858


1A - G 19561 - 70 - (2014/05)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.